විශේෂ සටහන 11

## මුදල් හා මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා අර්බුදකාරී අවධිවලදී පද්ධතිමය ද්‍රවශීලතා ගැටලු විසඳීම පිණිස මහ බැංකුවේ මැදිහත් වීම

### 1. හැඳින්වීම

2007 වසරෙහි මැද භාගයේ දී ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදය, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීමේ අවශ්‍යතාව සහ පද්ධතිමය අර්බුද කළමනාකරණය කිරීමේදී සහ වැළැක්වීමේදී මහ බැංකුවල මූලික භූමිකාව කෙරෙහි අලුතින් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නව උනන්දුවක් ඇති කිරීමට හේතු විය. ගෝලීය මූල්‍ය අර්බුදය විසින් ඇති කරන ලද කැළඹීමට ප්‍රතිචාර වශයෙන් ලොව පුරා මහ බැංකු විසින් මූල්‍ය ආයතන සහ වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සඳහා නව උපකරණ සහ පවතින උපකරණ ද භාවිතා කරන ලදී. 1948 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු ඇතිවූ දරුණුතම ආර්ථික අර්බුදයට ශ්‍රී ලංකා ආර්ථිකය 2022 කාලපරිච්ඡේදය තුළ දී මුහුණ දුන්නේය. එම අර්බුදය රටේ මූල්‍ය පද්ධතියෙහි අවදානම හා අවදානමට ලක්වීමට ඇති හැකියාව ඉහළ නංවමින්, මූල්‍ය පද්ධතියට බලපෑම් සිදු කර ඇත. රටෙහි අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් නිසා පැනනැගුණු විවිධාකාර අභියෝගවලට දේශීය මුදල් වෙළඳපොළට මුහුණ පෑමට සිදු විය. මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව හිඟ මට්ටම්වල පැවති අතර, මුදල් වෙළඳපොළ තුළ සෙසු පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීමේදී පනවා තිබූ සීමාවලට යටත් වීම හේතුවෙන් වෙළඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතාව බෙදී යෑමේ සැලකිය යුතු අසමානතාවක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සක්‍රීය මූල්‍ය මැදිහත් වීමේ භූමිකාවක අවශ්‍යතාව තහවුරු කරමින් වෙළඳපොළ සහභාගිවන්නන් දැඩි ලෙස මහ බැංකු පහසුකම් ලබා ගැනීම වෙත යොමුව පැවතිණි. එබැවින්, මුදල් හා මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා සුදුසු උපකරණ හරහා ද්‍රවශීලතාව සැපයීමේ කාර්යභාරය ඉටු කිරීමට මහ බැංකුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. අසාමාන්‍ය හෝ අර්බුද සහිත කාලසීමා තුළදී ශ්‍රී ලංකාවේ මුදල් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා පද්ධතිමය ද්‍රවශීලතා ගැටළු විසඳීමේදී මහ බැංකුවේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම පිළිබඳව දැනුම්වත් කිරීම සහ අවබෝධය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන මෙම විශේෂ සටහන ඉදිරිපත් කරනු ලැබේ.

### 2. ද්‍රවශීලතා කළමනාකරණයේදී මහ බැංකුවේ කාර්යභාරය

'ද්‍රවශීලතාව' යන යෙදුම සඳහා එය භාවිතා වන සන්දර්භය මත පදනම්ව පුළුල් අර්ථකථන කිහිපයක් ඇත. සාමාන්‍යයෙන් ද්‍රවශීලතාව පිළිබඳ සංකල්ප 3 ක් ද්‍රවශීලතා කළමනාකරණයට අදාළ වේ. පළමුවැන්න 'වෙළඳපොළ ද්‍රවශීලතාවයි' (Market Liquidity). එය කෙටි දැනුම්දීමකින් හා වෙළඳපොළ මිල කෙරෙහි සීමිත බලපෑමක් ඇතිව සහ සැලකිය යුතු අලාභයකින් තොරව මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හැකියාවයි. එබැවින් වෙළඳපොළ ද්‍රවශීලතාව, වෙළඳපොළ පුළුල් වීමට සහ ඔරොත්තු දීමේ හැකියාව සමග සම්බන්ධ වේ. දෙවැන්න නම්, 'අරමුදල් ද්‍රවශීලතාවයි' (Funding Liquidity). එයින් අදහස් කරන්නේ වෙළඳපොළ පිළිගත හැකි පිරිවැයක් යටතේ නියමිත වේලාවට පියවීම් සිදු කිරීම සඳහා මූල්‍ය ආයතන වත්කම් විකිණීමෙන් හෝ ණය ගැනීම මගින් අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්නයි. තෙවැන්න නම්, 'මහ බැංකු ද්‍රවශීලතාවයි' (Central Bank Liquidity). එය මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ අරමුණ ඉටු කර ගැනීම සඳහා බැංකු ආයතන මහ බැංකුව සමග යම් දිනෙක පවත්වාගෙන යන සංචිත ගිණුම්වල ශේෂයන්හි එකතුවට සමාන වේ. මෙය සමස්ත ද්‍රවශීලතාව නියෝජනය කරයි. එනම්, මහ බැංකුව විසින් මෙහෙයුම් කටයුතු සඳහා බැංකු පද්ධතියට සපයන සංචිත ප්‍රමාණයයි (Cecchetti & Disyatat 2009).

කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සඳහා වාණිජ බැංකුවල සංචිත ප්‍රමාණය මෙහෙයවීම සඳහා යොදා ගන්නා රාමුව, මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ සහ මෙවලම් ලෙස විස්තර කෙරේ. මහ බැංකු ද්‍රවශීලතා කළමනාකරණයෙහි මූලික පරමාර්ථය වන්නේ පොලී අනුපාතික හැසිරවීම සහ ගෙවීම් පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකු පද්ධතියේ සමස්ත සංචිත මට්ටම නියාමනය කිරීමයි. එබැවින්, වෙළඳපොළ පොලී අනුපාතික සහ ණය මැවීම, ද්‍රවශීලතාව හා සමීපව සම්බන්ධ වන බැවින්, මහ බැංකු ද්‍රවශීලතාව, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමේ වැදගත් විචල්‍යයක් වේ. කෙසේ වෙතත්, පුළුල් ලෙස බලන කල, මිල හා මූල්‍ය පද්ධති ස්ථායීතාව යන අරමුණු දෙකම සාක්ෂාත් කර ගැනීමේදී මහ බැංකුවේ අරමුණුවලට අදාළ සියලුම මූලික ක්‍රියාකාරකම් සඳහා සක්‍රීය ද්‍රවශීලතා කළමනාකරණය අඩු වැඩි වශයෙන් සම්බන්ධ වේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ද්‍රවශීලතා කළමනාකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, ගෙවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීමට ද එය ඉතා වැදගත් වේ. ඒ අනුව, ද්‍රවශීලතා කළමනාකරණයේදී භාවිතා කරනු ලබන මහ බැංකුවක මුදල් ප්‍රතිපත්ති උපකරණ මහ බැංකුවේ අරමුණු කෙරෙහි, එනම් මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව යන දෙකටම බලපාන ද්‍රවශීලතාවයෙහි සහ මුදල්වල පිරිවැයෙහි (පොලී අනුපාතික) උච්චාවචන සීමා කිරීමට දායක වේ.

ලොව පුරා මහ බැංකු සහ මුදල් අධිකාරීන්, මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමේදී මුහුණ දෙන අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. විශේෂයෙන්ම අර්බුදකාරී අවධිවලදී, අරමුදල්

8

සහ වෙළඳපොළ ද්‍රවශීලතාව සමග මහ බැංකු ද්‍රවශීලතා සැපයීම ධනාත්මක සම්බන්ධයක් පෙන්නුම් කරයි. අවසාන ද්‍රවශීලතා සැපයුම්කරු ලෙස මහ බැංකුවේ ධාරිතාව අනුව, මහ බැංකු විවිධ ආකාරයෙන් බැංකු පද්ධතියට ද්‍රවශීලතාව සපයයි. ඒවා අතර, බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සහ එමගින් සාමාන්‍ය ආර්ථික තත්ත්වය තුළ කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවීමට යොදා ගන්නා ප්‍රධාන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණය වනුයේ විවෘත වෙළඳපොළ කටයුතු හරහා අරමුදල් සැපයීමයි. තාවකාලික පදනමක් මත ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව මූල්‍ය ආයතන සමග ගනුදෙනුවල නිරත වන අතර, එහිදී යළි මූල්‍ය ආයතන වෙත විකිණීම සඳහා වන එකඟතාව යටතේ රජයේ සුරැකුම්පත් මිලදී ගනී. එසේම, ස්ථිර පදනම මත ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව ද්විතීයික වෙළඳපොළෙහි සුරැකුම්පත් මිලදී ගනියි. විවෘත වෙළඳ කටයුතු තරගකාරී ලංසු වෙන්දේසි මඟින් පවත්වනු ලබන බැවින්, මෙම වෙන්දේසි නිශ්චිත මූල්‍ය ආයතනයක් වෙත ඉලක්ක නොවේ. එසේම, ගෙවීම් හා පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා සහ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව අදාළ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් යුතුව සමස්ත සංචිත මට්ටම නියාමනය කිරීම සඳහා මහ බැංකුවේ අභිමතය පරිදි මෙම මෙහෙයුම් කටයුතු සිදු කෙරේ.

තවද, ද්‍රවශීලතාව සමස්තයක් ලෙස වෙළඳපොළ වෙත සැපයීම වෙනුවට විශේෂිත ආයතන ඉලක්ක කර ගනිමින් ද්‍රවශීලතාව සැපයීම ද මහ බැංකුව සිදු කරයි. පවතින අරමුදල් මත පදනම්ව මූල්‍ය ආයතනයකට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී සිදු කළ හැකි මෙම ආකාරයේ ගනුදෙනු සඳහා නිත්‍ය පහසුකම සාමාන්‍ය උදාහරණයකි. නිදසුනක් වශයෙන්, අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි ගනුදෙනු සඳහා අදාළ කොන්දේසි දැඩි වූ විට හෝ යම් මූල්‍ය ආයතනයක් කෙටිකාලීන අරමුදල් පීඩනයකට මුහුණ දෙන විට අවශේෂ අරමුදල් අවශ්‍යතා දිනය අවසානයේදී සපුරාලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිත්‍ය ණය පහසුකම හරහා සහභාගිත්ව ආයතනවලට ඍජුවම ද්‍රවශීලතාව සපයනු ලැබේ. එමෙන්ම, මූල්‍ය ආයතනයක් සතුව දිනය අවසානයේදී අතිරික්ත මුදල් පවතී නම්, එම අතිරික්තය නිත්‍ය තැන්පතු පහසුකම භාවිතයෙන් මහ බැංකුවේ තැන්පත් කර පොලී ආදායමක් උපයා ගත හැකිය. මෙම මෙවලම් ද්‍රවශීලතා කළමනාකරණයේදී මහ බැංකුව භාවිත කරන සාම්ප්‍රදායික උපකරණ ලෙස සැලකේ. සාම්ප්‍රදායික උපකරණ හා ද්‍රවශීලතා පහසුකම් භාවිතය හැරුණු විට, මූල්‍ය අර්බුද සහ වෙළඳපොළ අවිනිශ්චිතතා හේතුවෙන් ද්‍රවශීලතා මෙහෙයුම් සිදු කිරීම සහ මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළඳපොළ වෙත මහ බැංකු ද්‍රවශීලතාව සැපයීම සඳහා වන උපකරණ කට්ටල පුළුල් කිරීමට මහ බැංකු වෙත පෙළඹුමක් ඇති වේ.

**දේශීය බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතා හිඟය**

විදේශ ණය ගෙවීම්, පැවති අවිනිශ්චිතතා හේතුවෙන් ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම සහ විදේශ විනිමය වෙළඳපොළට මහ බැංකුව මැදිහත් වීම යනාදිය හේතුවෙන් දේශීය බැංකු පද්ධතිය තුළ ඇති වූ ද්‍රවශීලතා හිඟය, 2021 සැප්තැම්බර් මස මුල් භාගයේ සිට පද්ධතිමය ද්‍රවශීලතා හිඟයක් බවට ක්‍රමිකව පරිවර්තනය විය. සාර්ව ආර්ථික සමතුලිතතාව යළි තහවුරු කිරීමේ අරමුණින් 2022 වසරේදී පෙර නොවූ විරූ ආකාරයේ ප්‍රතිපත්ති මෙහෙයුම් කෙරෙහි යොමු වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. පිරිහී යමින් පැවති ආර්ථික තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහ බැංකුව පළමුව ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700 කින් ඉහළ නැංවූ අතර, පසුව වරින් වර පොලී අනුපාතික ඉහළ නැංවීය. කෙසේ වෙතත්, වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය අඛණ්ඩව ඉහළ යෑම සහ වෙළඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතාව බෙදී යෑමේදී පැවති අසමතුලිතතාව, පද්ධති ද්‍රවශීලතා හිඟයක් නිර්මාණය කිරීමට හේතු විය. එක් එක් සහභාගිත්ව ආයතනවල පැවති ද්‍රවශීලතා හිඟයට වඩා සමස්තයක් වශයෙන් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟයක් පැවතීම හේතුවෙන් බොහෝ බැංකුවලට මහ බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතාව (සංචිත අවශ්‍යතාව) සම්පූර්ණ කර ගැනීම අභියෝගාත්මක විය. අන්තර්බැංකු මුදල් වෙළඳපොළ ගනුදෙනු අවම මට්ටමක තිබියදී එවන් සමස්ත වෙළඳපොළ පීඩන තත්ත්වයක් පැවතීම මූල්‍ය හා සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් පැවතුණි. ආර්ථිකය සඳහා අරමුදල් සම්පාදන කාර්යයේදී බැංකු වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, ආර්ථිකයේ ගෙවීම් පියවීම් පද්ධතියේ ප්‍රධාන අතරමැදිකරුවන් වශයෙන් ක්‍රියා කරති. එබැවින් එක් බැංකුවක ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලිය නොහැකි වුවහොත්, එය සමස්ත ගෙවීම් පියවීම් පද්ධතියම අවහිර වීමට බලපෑ හැකි අතර, එමඟින්, බැංකු පද්ධතියේ සිදු විය හැකි බිඳවැටීම් තුළින් අනෙකුත් මූල්‍ය ආයතනවල ද බිඳවැටීම් සිදු විය හැකි අතර, ද්‍රවශීලතාව අවශ්‍ය පරිදි සපුරා ගත හැකි වූ විට එවැනි බිඳවැටීම් වළක්වාගත හැකිය. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන අතර පවත්නා අන්තර් බැඳියාව හේතුවෙන් මූල්‍ය ස්ථායීතාව මත පුළුල් ප්‍රතිවිපාක ඇති කළ හැකි පැතිර යෑමේ මෙන්ම පිටාර යෑමේ ප්‍රතිවිපාකය (Contagion and Spillover Effects) හේතුවෙන් අවසාන වශයෙන් මූල්‍ය ස්ථායීතාව, මහජන විශ්වාසය මෙන්ම මූර්ත ආර්ථිකයට ද සැලකිය යුතු බලපෑමක් ඇති විය හැකිය. එබැවින් මූල්‍ය අස්ථායී බව මෙන්ම, මූල්‍ය පද්ධති අස්ථායී බව වළකාලීමේ හා කළමනාකරණය කිරීමේ මහ බැංකු කාර්යභාරය ද තර්ජනයට ලක් කිරීමේ හැකියාව ඇති දිගුකල් පවත්නා ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවලදී ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් හා මූල්‍ය යන දෙඅංශයෙහිම ස්ථායීතාව සහතික කිරීම සඳහා පුළුල් පරාසයක පැතිරුණු සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ භාවිතා කිරීමට කටයුතු කළේය.

**ද්‍රවශීලතා පීඩනයක් පවතින කාලපරිච්ඡේදවලදී සාම්ප්‍රදායික උපකරණ භාවිතය**

2022 වසරේ පළමු භාගය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ හිඟ ද්‍රවශීලතාව 2022 වසරේ අග භාගය තුළ අඩු විය. බැංකු අතර පවත්නා ද්‍රවශීලතා පීඩනය අවම කිරීමේ අරමුණින්,

ද්‍රවශීලතා මෙහෙයුම් පුළුල් කිරීම, කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව සැපයීම සහ සපුරා ගත නොහැකි වූ ද්‍රවශීලතා අවශ්‍යතා නිත්‍ය පහසුකම හරහා සීමාවකින් තොරව සපුරා ගැනීමට අවස්ථාව දීම යනාදිය ද්‍රවශීලතාව නිතිපතා කළමනාකරණය කිරීමේදී මහ බැංකුව විසින් උපයෝගී කර ගන්නා ලදී. මහ බැංකුව දැඩි වශයෙන් වෙළඳපොළට මැදිහත් වීම නව සංකල්පයක් නොවන අතර, කෝවිඩ්-19 වසංගතය කාලයේදී සිදු කළ ආකාරයට මූල්‍ය වෙළඳපොළට අසාමාන්‍ය ප්‍රමාණයකින්, වේගයකින් සහ අරමුණකින් යුතුව අවශ්‍ය තරම් ද්‍රවශීලතාව සැපයීම සහ ණය ගැනුම් පිරිවැය අවම කිරීම සහ එමගින් මූල්‍ය වෙළඳපොළ යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමට මහ බැංකුව කටයුතු කොට ඇත. ඒ අනුව, මහ බැංකුව පුළුල් ලෙස විවෘත වෙළඳපොළ කටයුතු සිදු කරන ලද අතර, කෝවිඩ් වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය අරමුදල් සැපයීමට පුළුල් පරාසයක ඇප සුරැකුම්පත් පිළිගනිමින් සහනදායී ණය යෝජනා ක්‍රමයක් (කෝවිඩ්-19 සෞභාග්‍යා පුනරුද ණය පහසුකම) හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, 2022 වසර අවසාන භාගයේ සිට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වුවද, ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය මන්දගාමී තත්ත්වයක පැවතීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. ඒ සමගම, බලපත්‍රලාභී වාණිජ බැංකු තම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වෙළඳපොළ පදනම් කරගත් අරමුදල් සපයා ගැනීමෙන් තොරව, මහ බැංකුවේ විවෘත වෙළඳපොළ පහසුකම් යටතේ එක්දින පදනමින් සපයනු ලබන නිත්‍ය පහසුකම අඛණ්ඩව හා වැඩි වශයෙන් උපයෝගී කර ගනිමින් ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගන්නා ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු සිය අරමුදල් සපයා ගැනීමට අනෙකුත් විකල්ප භාවිතා කිරීමෙන් පසුව පමණක් සලකා බැලිය යුතු මහ බැංකුව විසින් එක් දින පදනමින් සපයන ලද පහසුකම් මත එලෙස වැඩි වශයෙන් රඳා පැවතීම අඩු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමක් දක්නට නොලැබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකුවල එවැනි හැසිරීම්, මහ බැංකුව විසින් මුදල් වෙළඳපොළ, එනම් ඒක්ෂණ ණය වෙළඳපොළ සහ ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළ ක්‍රියාකාරී කරවීමට ගන්නා ලද උත්සාහයන් සඳහා බලපෑම් සිදු කළ අතර, ගෙවීම් හා පියවීම් පද්ධතිය හරහා ආර්ථිකය වෙත අරමුදල් සුමටව ගලායෑමට බාධා ද ඇති කළේය.

ඒ අනුව, මුදල් හා මූල්‍ය අංශවල පැවති අවදානම් කළමනාකරණය කිරීම ඇතුළු සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව අත් කර ගැනීමේ අරමුණ ඇතිව 2022 අප්‍රේල් මස සිට ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අමතරව, මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළ කටයුතු යටතේ සපයනු ලබන නිත්‍ය පහසුකම සඳහා සීමා පනවන ලදී. ඒ අනුව, 2023 ජනවාරි මස 16 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු සතු අතිරික්ත ද්‍රවශීලතාව තැන්පත් කොට පොලී උපයා ගත හැකි එක්දින පදනමින් සපයනු ලබන නිත්‍ය තැන්පතු පහසුකම ලිත් මාසයක් ඇතුළත උපරිම දින 05 කට සීමා කරන ලදී. ඒ සමගම, සිය දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සුරැකුම්පත් යටතේ සපයනු ලබන නිත්‍ය ණය පහසුකම, එක් දිනක පවත්නා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90 ක ප්‍රමාණය දක්වා පමණක් ලබාගත හැකි වන පරිදි සීමා කරන ලදී. මෙම සීමා කිරීම් හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු නිත්‍ය ණය පහසුකම යටතේ ණය ලබාගැනීම් සැලකිය යුතු ලෙස අඩුවූ අතර, ද්‍රවශීලතා ගැටලු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹවීම් කිරීමට මෙන්ම මුදල් වෙළඳපොළ හරහා අරමුදල් ලබාගැනීමට කටයුතු කිරීමට හේතු විය. තවදුරටත්, නිත්‍ය තැන්පතු පහසුකම සීමා කිරීම හේතුවෙන් ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරී වීමත්, අතිරික්ත ද්‍රවශීලතාව පැවති බැංකු වෙතින් හිඟ ද්‍රවශීලතාව සහිත බැංකු වෙතට අරමුදල් ගලා යෑමත් දක්නට ලැබිණි. මෙවැනි සීමා කිරීම් නිසා උද්ගත විය හැකි වෙළඳපොළ කැළඹීම් අවම කිරීම සඳහා ඉදිරියේදී අභ්‍යන්තර නිවැරදි කිරීම් කර ගන්නා තුරු මහ බැංකුව විසින් කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම හරහා බැංකු ආයතන වෙත ද්‍රවශීලතාව සපයන ලදී. වෙළඳපොළ පොලී අනුපාතික සමස්තයක් ලෙස අඩු වීම (එනම් වෙළඳපොළ පොලී අනුපාතික මෙන්ම රජයේ සුරැකුම්පත් පොලී අනුපාතික) සමග වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීම සහ අවදානම් සඳහා අයකරන වාරික අඩු කිරීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ස්ථාවරත්වයට සහාය වීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීමට මෙම ක්‍රියාමාර්ග හේතු විය.

### ද්‍රවශීලතා කළමනාකරණ රාමුව යටතේ සාම්ප්‍රදායික නොවන උපකරණ භාවිතය

මෙයට අමතරව, සමාජ පිරිවැය අවම කිරීමට උත්සාහ කරන අතරතුර, මූල්‍ය පද්ධතියෙහි සුරක්ෂිතභාවය උදෙසා අනාගතයේදී ඇති විය හැකි මූල්‍ය කම්පන සහ ඒවායේ ප්‍රතිවිපාක කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව සිය ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපාදන යටතේ පියවර ගණනාවක් ගනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව පද්ධතිය තුළ ද්‍රවශීලතා අවදානම අවම කිරීම සඳහා පෙර නොවූ විරූ පරිමාණයෙන් සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති භාවිතා කළේය. දැනට බලාත්මක නීතිමය ප්‍රතිපාදන යටතේ මූල්‍ය ආයතන හා මූල්‍ය වෙළඳපොළට ද්‍රවශීලතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සාම්ප්‍රදායික නොවන නව ද්‍රවශීලතා සැපයුම් මෙවලම් නිර්මාණය කරන ලද අතර, අර්බුදයකට පෙර සූදානමක් ලෙස මෙන්ම පද්ධති ද්‍රවශීලතා පීඩනය අවම කිරීම අරමුණු කර ගනිමින් යොදා ගන්නා ලද සාම්ප්‍රදායික නොවන එවැනි පහසුකම් පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

### I. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා උපකාරක පහසුකම හඳුන්වා දීම

ද්‍රවශීලතා උපකාරක පහසුකම (Liquidity Assistance Facility) පවත්නා නෛතික රාමුව යටතේ එනම්, මුදල් නීති පනතේ අංක 82 සහ 83 (1) (c) වගන්ති යටතේ සපයනු

ලබන පහසුකමකි. මෙය බැංකු ආයතනවලට ද්‍රවශීලතා උපකාරක පහසුකමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත හැකි ණය මුදලක් වන අතර, එම ණය මුදල දින 180 නොඉක්මවන ඕනෑම නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා පොරොන්දු නෝට්ටුවක් මගින් සුරක්ෂිත කරන ලද රාජ්‍ය සුරැකුම්පත් ඇප වශයෙන් තබා ලබාගත හැකිය. එසේම, මෙම පහසුකම පවතින බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) මත ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලැබූ පොලී අනුපාතිකයක් යටතේ ලබාගත හැකිය.

මෙම පහසුකම යටතේ ලබා දෙනු ලබන ණය ප්‍රමාණය, ණය ඉල්ලුම් කරනු ලබන බැංකුවෙහි ද්‍රවශීලතා අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තක්සේරු කිරීමෙන් පසු තීරණය කරනු ලබයි. මෙම පහසුකම හඳුන්වා දීමත් සමග, විවට වෙළඳපොළ කටයුතු යටතේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගනු වෙනුවට දිගුකාලීනව ද්‍රවශීලතා අවශ්‍යතා තරගකාරී මිලකට සපුරා ගැනීමට බැංකුවලට අවස්ථාව පවතී. මූල්‍ය පද්ධතියේ පවත්නා ද්‍රවශීලතා ගැටලු විසඳීමට සහ බැංකු ආයතන වෙත ඇති වන බලපෑම අවම කිරීමට මෙම පහසුකම යටතේ හැකියාව පවතී. එබැවින්, හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා පහසුකමක් ලබා ගැනීමකින් ඇති වන අපකීර්තියේ බලපෑම (Stigma Effect) වැළැක්වීම සඳහා මෙම පහසුකම වඩාත් ඵලදායී ක්‍රමයක් වේ.[1]

## 2. හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම සහ එහි මෙහෙයුම් රාමුව ශක්තිමත් කිරීම

බැංකු පද්ධතියෙහි ඇති විය හැකි අවදානමට සූදානම් වීමේ ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සිය හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම් (Emergency Liquidity Assistance) රාමුව ශක්තිමත් කරන ලදී. මුදල් නීති පනතේ 86 වන වගන්තිය අනුව, මුදල් සහ බැංකු ස්ථායීතාව සඳහා දැඩි අහිතකර බලපෑම් එල්ල විය හැකි හදිසි හෝ ඇති වීමට ඉතා ආසන්න මූල්‍ය අර්බුදයක් පවතින කාලසීමාවලදී ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකු ආයතන වෙත ණය සහ අත්තිකාරම් ලබාදීමට ඉඩප්‍රස්ථාව ලබාදී ඇත. ඒ අනුව, හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතිනක වශයෙන් විශේෂිත වූ එක් බැංකුවකට හෝ බැංකු ආයතන කිහිපයකට බලපානු ලබන ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා ලබාදෙනු ලබන ණය හෝ අත්තිකාරමකි. හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකමෙහි මූලික අරමුණ වනුයේ ද්‍රවශීලතා හිඟය හේතුවෙන් බුන්වත්භාවය ඇති වීමට අවදානමක් පවතින විට එය වැළැක්වීම සහ ඒ තුළින් අනෙකුත් ආයතනවලට ඇති විය හැකි බලපෑම සහ බාහිරතා වැළැක්වීමයි. බැංකු ආයතනයක් සිය අරමුදල් ද්‍රවශීලතාව සපුරා ගැනීමේදී ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දෙනු ලබන්නේ නම්, එය එම බැංකු ආයතනය අසාර්ථක වීමට හේතු වේ. එබැවින්, මුදල් ප්‍රතිපත්තිය යටතේ කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සඳහා ද්‍රවශීලතා කළමනාකරණය කිරීමට අමතරව, තාවකාලික ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙනු ලබන බැංකු ආයතනවලට ද්‍රවශීලතාව සැපයීමේ විශේෂිත ක්‍රියාමාර්ගයක් ලෙස මහ බැංකුව, මෙම හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම යොදා ගනී. ඒ අනුව, ඉහත නීතිමය ප්‍රතිපාදන යටතේ බුන්වත් නොවන නමුත් තාවකාලික ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී ඇති ඕනෑම බැංකු ආයතනයක් එහි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි විවිධ ඇප සුරැකුම් ගණනාවක් මත මෙම හදිසි ද්‍රවශීලතා උපකාරක පහසුකම ලබා ගැනීමට සුදුසුකම් ලබයි. මෙම පහසුකම, ස්ථාවර පොලී අනුපාතිකයක් යටතේ එනම්, පවතින බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය මත ආන්තිකයක් එකතු කොට නිර්ණය කරනු ලබන බැංකු අනුපාතිකය (Bank Rate) යටතේ ලබාගත හැකිය. ඒ අනුව, සංචිත ආකාරයෙන් ද්‍රවශීලතාව නිර්මාණය කිරීමට මහ බැංකුවට අනන්‍ය වූ හැකියාව උපයෝගී කර ගෙන සහ අවසාන ණය දෙන්නා (Lender of Last Resort) වශයෙන් සිය ප්‍රධාන වගකීමක් ලෙස බැංකු ආයතන වෙත මහ බැංකුව මෙම පහසුකම ලබා දෙයි. තවද, බැංකු ආයතන, සිය බැංකු කටයුතු සම්බන්ධව දැඩි කොන්දේසි අනුගමනය කිරීම සහතික කිරීම අවශ්‍ය වන අතර, ඒ තුළින් සදාචාර උපද්‍රවය (Moral Hazard) අඩු වීම සහ මහ බැංකුවේ ස්වාධීනත්වයට බාධා පමුණුවනු ලබන හෝ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවට බාධා ඇති කරනු ලබන මූල්‍යමය හානි අවම වීමක් සිදු වේ.[2]

ඉහත ද්‍රවශීලතා පහසුකම් සපයමින්, ශ්‍රී ලංකා මහ බැංකුව, මූල්‍ය අංශයේ පීඩනයක් සහිත තත්ත්වයකදී වඩාත් විචක්ෂණශීලී ලෙස කටයතු කිරීමට ඇති හැකියාව සහ මූල්‍ය අංශයේ බුන්වත්භාවය සඳහා ඇති විය හැකි තර්ජන කල්තියා ඉවත් කිරීමට ඇති හැකියාව මෙන්ම ඒ සඳහා වන මහ බැංකුවේ අභිමතය පෙන්නුම් කොට ඇත. මූල්‍ය වෙළඳපොළ සහභාගිවන්නන් අතර මූල්‍ය පද්ධතිය පිළිබඳව පවත්නා විශ්වසනීයත්වය නැවත ඇති කිරිම සහ වත්කම් ක්ෂණිකව විකිණීම වැළැක්වීම සහ සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීම ද එමගින් සිදු කෙරේ.

### සමෝධානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් සියල්ලම පාහේ මහ බැංකු විධිවිධාන යටතේ පවත්නා සියලු අත්‍යවශ්‍ය කටයුතු හා සම්බන්ධ වේ. එය, මුදල් ප්‍රතිපත්ති යාන්ත්‍රණය සඳහා මෙන්ම ගෙවීම් සහ පියවීම් පද්ධති සුමටව පවත්වාගෙන යෑම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් පසුබිමක් සපයනු ලබයි. නිදහසින් පසුව රට මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදය තුළදී මුහුණ දුන් ද්‍රවශීලතා අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මෙම ද්‍රවශීලතා පහසුකම්

1 මූල්‍ය ආයතන විසින් මහ බැංකු ණය පහසුකම් ලබාගැනීම නිසා, ඔවුන්ගේ යහපත් මූල්‍ය පැවැත්ම පිළිබඳ සෘණාත්මක සංඥා නිකුත් වනු ඇතැයි අපේක්ෂාවෙන් එම පහසුකම් ලබාගැනීමට ඇති අකැමැත්ත මෙයින් අදහස් කෙරේ.

2 බැංකු ආයතනයක් සිය දෛනික ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් කටයුතු සඳහා වෙන් කරන ලද අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සලකා නොබැලීමට පෙළඹී සිටී නම් ඒ හේතුවෙන් සදාචාර උපද්‍රවයක් ඇති විය හැකිය.

නිශ්චිතවම මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. බැංකු සහ මූල්‍ය අංශයෙහි පෙර නොවූ විරූ අභියෝග කළමනාකරණය කිරීමේදී, දේශීය මුදල් වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව ඇති විය හැකි ද්‍රවශීලතා ගැටලු වැළැක්වීම සඳහා මහ බැංකුවට නවතම උපකරණ උපයෝගී කර ගැනීමේ අවශ්‍යතාව ඇති කරනු ලබයි. මේ අනුව, මිල ස්ථායීතා අරමුණ සපුරා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සාම්ප්‍රදායික සහ සම්මත ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ මගින් සහතික කරයි. එමෙන්ම, වඩාත් දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් තුළ මහ බැංකුවේ ශේෂ පත්‍රයෙහි ශක්තිමත් භාවය මත සැලකිය යුතු බලපෑමක් ඇති නොකොට, ඇති විය හැකි සැලකිය යුතු පද්ධති අවදානම් ඉවත් කරමින් මූල්‍ය වෙළඳපොළ ස්ථායී කිරීම සඳහා මහ බැංකුව, සාම්ප්‍රදායික නොවන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ වඩාත් ඵලදායීව සහ කාලීනව භාවිතා කරයි.

මූලාශ්‍ර:


1. Allen, F., Carletti, E., Krahnen, J.P., and Tyrell, M. (Eds.). (2011). Liquidity and Crises, Oxford University Press.
2. Andrew, H., and Lorie L. (2022). 'Market dysfunction and central bank tools', Markets Committee Working Group paper, Federal Reserve Bank of New York.
3. Bagehot, W. (1873). 'Lombard Street: A Description of the Money Market', London.
4. Cecchetti, S.G., and Disyatat, P. (2009). 'Central bank tools and liquidity shortages' (www.newyorkfed.org/research/conference/2009).
5. Cao, J., and G. Illing (2008). Liquidity shortages and monetary policy, CESifo Working Paper Series No. 2210, Available at: SSRN: http://ssrn.com/abstract1090825.
6. Corbo, V. (2010). 'Financial stability in a crisis: What is the role of the central bank', BIS Papers, 51, pp. 27-30.
7. Douglas, W.D., Raghuram, G.R. (2003). 'Liquidity Shortages and Banking Crisis', NBER WP Series 10071.
8. Holmström, B., and J. Tirole. (1998). 'Private and public supply of liquidity', Journal of Political Economy, 106, pp. 1–40.
9. Praet, P. (2016). 'The ECB and its role as lender of last resort during the crisis', Speech, 10 February.


8